# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1974/15 - 2016 ජූලි මස 05 වැනි අඟහරුවාදා - 2016.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආයෝජන ප්‍රවර්ධන විෂය භාර අමාත්‍යවරයා වන්නා වූ සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම වන මා විසින්, 2011 ජූලි මස 11 වැනි දින අංක 1714/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ පළකරනු ලැබූ නියමයට අතිරේකව, මෙම නියමය මගින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශ කර සිටිමි. එනම්,

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදානය කරන ලද කාලසීමාව දීර්ඝ කිරීමේ අරමුණින් 2011 ජූලි මස 11 වන දින අංක 1714/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමයේ (4) වන වගන්තිය පහත දැක්වෙන ලෙස කියවෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''(4) ඉහත කී කොළඹ 1, කොටුවේ, උසස් ස්ථරයේ නිවාස සහ නවීන සාප්පු සංකීර්ණයක් ඇතුළුව මිශ්‍ර උපයෝගීතා සංකීර්ණයක් ලෙස සුඛෝපභෝගී හෝටලයක් ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතිය'' 2019.06.30 දින එකී ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කළ යුතු බවත්,

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2016 ජුනි මස 24 වැනි දින,
කොළඹ දී ය.

07 - 854